# 01.හැඳින්වීම



# 01.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිළිබඳ හැඳින්වීම

## 1.1 කොට්ඨාසයේ හැඳින්වීම

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම :- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දෙහිවල.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලිපිනය :- අංක 154, ගාලුපාර, දෙහිවල.
- මැතිවරණ කොට්ඨාසය :- දෙහිවල.
- දිස්ත්‍රික්කය :- කොළඹ.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාසය :- දෙහිවල බටහිර.

බස්නාහිර පළාතට අයත් කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, කොළඹ නගරයේ සිට කිලෝ මීටර් 10 ක් පමණ දකුණු දෙසට වන්නට පිහිටා ඇති ,වර්ග කිලෝ මීටර් 10 කින් පමණ යුක්ත නාගරික ප්‍රදේශයකි.උතුරින් දෙහිවල ඇළ සහ කෝට්ටේ නගර සභා සීමාවෙන්ද ,දකුණින් ගල්කිස්ස සහ බටහිර කව්ඩාන ග්‍රාම නිලධාරී කොට්ඨාස සීමාවෙන් ද නැගෙනහිරින් වේරුස් ගඟේ හා බොල්ගොඩ ඇලේ කොටසකින්ද කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවෙන්ද ,බටහිරින් ස්වාභාවික වෙරළ බඩ තීරයෙන්ද ,මායිම් වී ඇති මෙය ග්‍රාම නිලධාරි වසම් 15 කින් යුක්ත වේ.

බහු වාර්ගික ජනගහනයක් වාසය කරන මෙම කොට්ඨාසයේ ඒ නිසාම බහු සංස්කෘතියක් ද ඇති වී තිබේ. කොළඹ වාණිජ නගරයට ඍජුව සම්බන්ධ වන්නා වූ පරිවහන පද්ධතිය මගින් අවට ප්‍රදේශය හා මනා සම්බන්ධතාවයක් පෙන්වයි.මේ නිසාම එහි නාගරීකරණය ඉතා ඉහළ මට්ටමක පවතී.කොළඹ -මාතර ප්‍රධාන මාර්ග හා කොළඹ බෙලිඅත්ත දුම්රිය මාර්ගය මෙම කොට්ඨාසය හරහා ගමන් කිරිමත් මෙහිලා වැදගත් වේ.එසේම අළුතින් ඉදිවෙන කොලඹ පානදුර වෙරළ බඩ මාර්ගය මෙම කොට්ඨාසයේ දෙහිවල මංසන්ධියට නුදුරින් ගමන් කිරිමත් නිසා මෙම කොට්ඨාසයට නව වටිනාකමක් එකතු වි ඇත.එසේම බටහිරින් මුහුදින් දීවෙන නිසා අලංකාර මුහුදු වෙරළක් ද උරුම වී ඇත.ජාතික සත්වෝද්‍යානය මෙම කොට්ඨාසයේ පිහිටා තිබීම මෙහි අභිමානවත් බව තවත් ඔප් නංවයි.

මානව හා භෞතික සම්පත් ඵලදායී ලෙස යොදා ගනිමින් ඒවා අතර සම්බන්ධීකරණය සඳහා වැදගත් වන පරිපාලමය ඒකකය ලෙස දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මෙම කොට්ඨාසය තුල වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

## 1.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටීම

### 1.2.1 නිරපේක්ෂ පිහිටීම

උතුරු අක්ෂාංශ 6.5’ 1” සිට 6.5’ 2” දක්වාද නැගෙනහිර දේශාංශ 78.5’ 1” සිට 79.5’ 2” අතර පිහිටා ඇත.

### 1.2.2 සාපේක්ෂ පිහිටීම

**උතුරින්** - දෙහිවල ඇල සහ කෝට්ටේ නගර සභා සීමාවෙන් ද,

**දකුණින්** - ගල්කිස්ස සහ බටහිර කව්ඩාන ග්‍රාම නිලධාරී කොට්ඨාස සීමාවෙන් ද,

**නැගෙනහිර** - වේරස් ගඟේ හා බොල්ගොඩ ඇලේ කොටසකින්ද, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවෙන්ද,


**බටහිරින්** - ස්වාභාවික වෙරළබඩ තීරයෙන්ද,


සීමා වී ඇති වර්ග කිලෝ මීටර් 8.42 ක් (හෙක්ටයාර් 842 ) තරම් වූ කුඩා භූමි ප්‍රදේශයක් අයත් වේ.

කොළඹ දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණය වූ 1.25% ක් පමණ වේ. පිහිටීම අතින් මෙම කොට්ඨාසයට ඉහළ වටිනාකමක් ඇතිවීමට හේතු කිහිපයක් බලපා තිබේ.

කොළඹ වාණිජමය නගරයට ඍජුව සම්බන්ධ වන්නා වූ පරිවහන පද්ධතිය මගින් අවට ප්‍රදේශය හා මනා සබඳතාවයක් පෙන්වයි. මේ නිසාම එහි නාගරීකරණය ඉතා ඉහල මට්ටමක පවතී. කොළඹ මාතර ප්‍රධාන මාර්ගය හා කොළඹ මාතර දුම්රිය මාර්ගය මෙම කොට්ඨාසය හරහා ගමන් කිරීමත් මෙහිලා වැදගත්වේ. තවද මෙම ප්‍රදේශයේ පිහිටීම ගැන සලකන කල බටහිරින් මුහුදින් සීමාවන නිසා අලංකාර මුහුදු වෙරළක්ද උරුම වී ඇත. දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාවද මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වේ.

**<u>කොට්ඨාසයේ පිහිටීම</u>**





Dehiwala
Kohuwala
Kalubovila
Dutugemunu
Dehiwala West
Dehiwala East
Udyanaya
Kawdana East
Karagampitiya
GNs
P-Codes
Dehiwala East 1130045
Dehiwala West 1130040
Dutugemunu 1130015
Galwala 1130035
Hathbodhiya 1130030
Jayathilaka 1130065
Kalubovila 1130025
Karagampitiya 1130070
Kawdana East 1130075
Kohuwala 1130020
Malwatta 1130060
Nedimala 1130055
Sri Saranankara 1130005
Udyanaya 1130050
Vilawala 1130010
N
Kilometers
0 0.25 0.5 1
GAMPAHA
KEGALLE
RATNAPURA
KALUTARA
Colombo
COLOMBO
KOLONNAWA
KADUWELA
HANWELLA
MAHARAGAMA
HOMAGAMA
PADUKKA
KESBEWA
MORATUWA
DEHIWALA
RATMALANA
SRI JAYAWARDANAPURA KOTTE
Indian Ocean
Area Detail
Legend
Town
Railway Line
Track Road
Main Road
Minor Road
GN Boundary
DS Boundary
District Boundary
Data source(s):
Survey Dept., Government of Sri Lanka
Updated as at: 17-Jan-2007
Produced on: 17-Jan-2007
Projection / Datum: Transverse Mercator Kandawala
GLIDE number: TS 2004-0001470LKA
Admin boundaries provided by: Survey Department, Gvt. of Sri Lanka
MapNumber: OCHA/LK/Colombo/Admin/ 002 / 01
This map is designed for printing on A4 size
The boundaries, names and the designations used on this map do not imply official endorsement or acceptance by the United Nations.
UN OCHA
© 2007 United Nations Office for the Coordination of Humanitarian Affairs, Sri Lanka

## 1.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සම්පත් පසුබිම

භූ විද්‍යාත්මක දෘෂ්ඨී කෝණයකින් බලන විට දී පෙනි යන්නේ වෙරළට ආසන්න, ලංකාවේ උන්නතාංශය මත කරන බෙදීම්වලට අනුව මීටර් 1- 125 අතරට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වශයෙන් මෙම ප්‍රදේශය හඳුනාගත හැකි බවයි. පාෂාණ ශ්‍රේණි අනුව සලකන විට දී ප්‍රාග් කේම්බ්‍රීය යුගයට අයත් උස් බිම් ශ්‍රේණියට අයත් උප ප්‍රභේද කලාපයක් ප්‍රදේශය තුළ වේ.

''ආග්නේය'' පාෂාණ වර්ගයට අයත් වන්නා වූ උප ප්‍රභේදයක් වන ''හෝන් බ්ලේන්'' භූමි පරිහරණයට හෝ වෙනත් අන්දමේ භෞතික හෝ සමාජ ආර්ථික අංශයෙන් බලපෑම් ඇති කරන ක්‍රියාවලියදක්වන වර්ගයක් නොවන්නේය. ප්‍රදේශය පහත් බිමක් වුවද, ජලවහන පද්ධතිය ආශ්‍රයෙන් ඉතා සුළු වශයෙන් මැටි, සිලිකා ව්‍යාප්තව ඇත. මෙම ඛාදන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙන් තැන්පත්වූ නවක නිධි පවතී. වගා කටයුතු මෙම පාංශු වර්ග ඇසුරින් ව්‍යාප්තව පවතී.

## 1.4 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉතිහාසය හා ඓතිහාසික වැදගත්කම

දෙහිවල ප්‍රදේශයේ ඉතිහාසය පිළිබඳව විවිධ අදහස් ජනප්‍රවාදයේ සඳහන් වේ.“දෙහිවල” යන නාමය සෑදී ඇති ආකාරය පිළිබඳව ජනප්‍රවාදය තුළ විවිධ අදහස් පවතී. “දිය+වල” යන වචන දෙක එකතු වීමෙන් “දෙහිවල” යන නාමය සෑදී ඇති බවට මතයක් පවතී. අතීතයේදී මෙම ප්‍රදේශය පොකුණු හා ජල වලවල් සහිත ප්‍රදේශයක් වූ බැවින් “ දියවල” ලෙස ප්‍රකට වූ බවත්, එය ජන වහරයේ දී පසුව “දෙහිවල” බවට පත් වූ බවටත්, ජනප්‍රවාදයේ සඳහන් වේ. අතීතයේ දී මෙම ප්‍රදේශය දෙහි වගාවට ඉතා ප්‍රසිද්ධ ප්‍රදේශයක් වූ බැවින් “දෙහිවන” එනම් “දෙහි කැළෑව” යන්න පසුව ජනවහරයේදී “දෙහිවල” ලෙස ප්‍රකට වූ බවද ජනප්‍රවාදයේ තවත් මතයක් පවතී. කෝට්ටේ රජු වයඹ පළාතෙන් දෙහි ගෙනෙන තුරු බලා නොසිට දෙහිවලින් අවශ්‍ය දෙහි ලබා ගත් බවට ජනප්‍රවාදය තුළ සඳහන් වන්නේ මේ නිසාය.

දෙහිවල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විවිධ ග්‍රාමයන්හි නම් නිර්මාණය වී ඇති ආකාරය පිළිබඳවද ජනප්‍රවාදය තුළ විවිධ අදහස් පවතී.

**<u>01. නැදිමාල</u>**

“නැදි + මයිලනු යන වචන එක්වීමෙන් “නැදිමාල” යන වචනය ජනවහරයට පැමිණි බවට අදහස් පවතී. මෙහිදී “නැදි” යනු “හේනේ නැන්දා” යනුවෙන් හඳුන්වන රජක කුල (ඩෝබී) කාන්තාවයි. “මයිලනු” යනු “හේනේ මාමා” නොහොත් රජක කුල (ඩොබි) පුරුෂයන්ය. මෙසේ නැදී (නැන්දලා ) හා මයිලනු (මාමලා) සිටි ගම නැදිමාල වූ බවට ජනප්‍රවාදයේ සඳහන් වේ. කොට්ටේ සිරි පැරකුම්බා රජු ඇතුළු රාජ සභාවේ ප්‍රභූන්ගේ රජක කුල කටයුතු ඉටු කල මෙම රෙදි නැන්දලාට හා රෙදි මාමලාට කෝට්ටේ රජු විසින් නැදිමාල ගම ගම්වර කරදුන් බවටද මතවාද පවතී. මීට අමතරව කෝට්ටේ සිරි පැරකුම්බා රජු ඇතුළු රාජ සභාවේ ප්‍රභූන්ගේ දැලි රැවුළු කැපූ පණික්ක කුලයේ අයටද කෝට්ටේ රජු විසින් නැදිමාල ගම්වර කර දුන් බවට ජනප්‍රවාදයේ සඳහන්වේ.

**<u>02.නිකපේ</u>**

නැදිමාල ගමට යාබඳව පිහිටා ඇති ඉතා කුඩා ග්‍රාමයක් වූ මෙය අතීතයේදී වටිනා දේශීය ඖෂධයක් වූ නික ගස් වලින් හා වෙනත් දේශීය ඖෂධ වලින් පිරී පැවති බවට ජනප්‍රවාදය තුළ අදහස් පවතී. "නික+පේ" එනම් "නික+කැලෑව" යනුවෙන් මෙම පෙදෙස හැඳින්වූ බවට පැරණි මතවාද පවතී. ගොවියන් විශාල ප්‍රමානයක් ගොවිතැන් කළ අත්තිඩිය වෙල්යායද මෙම ග්‍රාමයට අයත්ය.

**3.කරගම්පිටිය**

ධීවරකර්මාන්තයේ යෙදුනු කරාව කුලයට අයත් බොහෝ පිරිසක් මෙම ප්‍රදේශයේ ජීවත් වූ බැවින් මෙම ග්‍රාමයට "කරගම්පිටිය" යන නම ව්‍යවහාර වූ බවට ජනප්‍රවාදයේ සඳහන් වේ.

**04. උද්‍යාන**

අතීතයේදී "පට්ටියමුල්ල" ලෙස මෙම ප්‍රදේශය හඳුන්වා ඇත. කෝට්ටේ රජ වාසලට එලකිරි සැපයීම සඳහා වූ හරක් පට්ටිය මෙම ප්‍රදේශයේ පිහිටා තිබූ බවට සඳහන් වේ. රජවාසලට අයත් 500 ඉක්මවූ ගැල් ප්‍රමාණයක් හා ගැල් ගවයන් අති විශාල ප්‍රමාණයක් මෙම ප්‍රදේශයේ පැවති බවට ජනප්‍රවාදයේ අදහස් පවතී.

**05. විලවල**

වර්ෂා කාලවලදී මෙම ප්‍රදේශය පුරා ගලා ගිය මහා ජලකඳ හේතුවෙන් විවිධ ස්ථාන වල විල් හා වලවල් බොහොමයක් ඇති විය. විල් හා වලවල් වලින් ගහණ වූ බැවින් මේ ප්‍රදේශය "විලවල" ලෙස හැඳින්වූ බවට පැරැණ්නන් අතර අදහස් පවතී.

**06. පාමංකඩ**

පැපිලියාන සුනේත්‍රාදේවී රජමහා විහාරයේ සිට කිරුලපන බලපොකුණ රජමහා විහාරයටත්, එතැනින් පාමන්කඩ විහාරයටත් උමගක් පැවති බවත්, මේධය කුමරු කොළඹ කොටුවේ රාජකීය හිර ගෙදරින් මුදවාගෙන ඒමට එම උමගතැනූ බවටත් ජනප්‍රවාදයේ සඳහන් වේ. පාමංකඩ ශ්‍රී මහා විහාරයෙන් නොනැවතී කොළඹ කොටුවේ රාජකීය හිර ගෙදර දක්වා උමග හැරීමෙන් අනතුරුව මෙධය කුමරු හිරගෙදරින් මුදවාගෙන පැපිලියානට රැගෙන ආ බවද කියවේ. බලපොකුණ රජමහා විහාරයත්, පාමංකඩ ශ්‍රී මහා විහාරයත් අතර බිම්කඩ ‘‘පා+මං+කඩ’’ එනම් ‘‘පාමංකඩ’’ ලෙස ප්‍රසිද්ධ වන්නට ඇතැයි ජනප්‍රවාදයේ අදහස් පවතී.

## 07. කළුබෝවිල

දෙහිවල ගාලුපාර කොටස හැර ප්‍රදේශයේ මැද පිහිටි කොටස භූගොලීය වශයෙන් හිල් වීදියේ කන්ද, නැදිමාලේ කන්ද, ආදී කඳු වළල්ලකින් වටවී තිබූ බවට අදහස් පවතී. මෙම කඳුවලට සම්බන්ධ පොළවයට කොටසෙහි අඩි කිහිපයක් යන තුරු කබොක් පසක්ද, ඉන් අනතුරුව දැවැන්ත කළු ගලක්ද පවතින බව කියවේ. මේ හේතුවෙන් මෙම කඳු පාමුල ප්‍රදේශයේ කළු ගලින් නිර්මිත ගල්වලවල් පැවති බවත්, එම ගල් වලින් ජලයෙන් පිරී අඳුරු විල් ලෙස දිස් වූ බවත්, ජනප්‍රවාදයේ අදහස් පවතී. බොහෝ කළු විල් සහිත ප්‍රදේශය එනම් ‘‘කළු+බොහෝ+විල’’, ‘‘කළුබෝවිල’’ ලෙස ප්‍රසිද්ධ වූයේ මේ නිසා බව කියවේ.

**1.5** ග්‍රාම නිලධාරි කොට්ඨාස,ගම් වල නම් හා භූමි ප්‍රමාණය පිළිබඳ තොරතුරු

| ග්‍රාම නිලධාරි කොට්ඨාශය | ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ භූමිප්‍රමාණය (ව.කි.මී.) | වීදි සංඛ්‍යාව | වීදි වල නම් |
|---|---|---|---|
| සරණංකර<br>**538 සී** | වර්ග කිලෝමීටර්-**0.46 (**හෙක්ටෙයාර්-**46.28)** | **වීදි-16** | ක්‍රීඩා මාවත |
| | | | ගෞඩර් පෙදෙස |
| | | | ජුලියන් පෙදෙස |
| | | | නෙළුම් මාවත |
| | | | පාසල් මාවත |
| | | | විමලසාර පාර |
| | | | ගුණාලංකාර මාවත |
| | | | ශ්‍රී මහ විහාර මාවත |
| | | | ශ්‍රී රාහුල මාවත |
| | | | ශ්‍රී සරණංකර ටෙරස් |
| | | | ශ්‍රී සරණංකර පාර |
| | | | බණ්ඩාරනායක මාවත |
| | | | බෝධිරුක්ඛාරාම පාර |
| | | | හාතිය මාවත |
| | | | යශෝධරා මාවත |
| | | | හත්බෝධිය පාර |
| විලවල<br>**537** | වර්ග කිලෝමීටර්-**0.57 (**හෙක්ටෙයාර්-**57.50)** | **වීදි-10** | අලුත් ගල්වල පාර |
| | | | කිරුළපන පාත් |

| | | | |
|---|---|---|---|
| | | | ද සිල්වා පාර<br>දුටුගැමුණු විදීය |
| | | | බෝධියවත්ත |
| | | | සුනන්දාරාම පාර |
| | | | සුජාතා මාවත |
| | | | ශ්‍රී මහ විහාර මාවත |
| | | | ශ්‍රී සරණංකර පාර |
| දුටුගැමුණු<br>**537 ඒ** | **වර්ග කිලෝමීටර්-0.76 (හෙක්ටෙයාර්-76.25)** | **වීදි-19** | ආතර් පෙදෙස |
| | | | ඇන්ඩර්සන් පාර |
| | | | ඉන්ද්‍රා මාවත |
| | | | එඩ්වඩ් පෙදෙස |
| | | | එස්.ද.එස් ජයසිංහ මාවත(පල්ලිය පාර) |
| | | | කාශ්‍යප මාවත |
| | | | ගර්ටල් පාසල් පාර |
| | | | ග්‍රීන්පාත් පාර |
| | | | දුටුගැමුණු විදීය |
| | | | පරාක්‍රම මාවත (එස්.ද.එස් ජයසිංහ මාවත) |
| | | | සුනන්දාරාම පාර |
| | | | සිරිගල් මාවත |
| | | | සුනේත්‍රාදේවී මාවත |
| | | | විජයමංගලා පාර |
| | | | පීටර්ස් පෙදෙස |
| | | | පෙරේරා මාවත |

| | | | |
|---|---|---|---|
| කොහුවල<br>**537 බී** | **වර්ග කිලෝමීටර්-0.96 (හෙක්ටෙයාර්-96.5)** | **වීදි-19** | මුදලි මාවත |
| | | | රේමන්ඩ් පාර<br>අනුර මාවත |
| | | | අනුර මාවත-2 වන පටුමග |
| | | | ආනන්ද මාවත |
| | | | ඇන්ඩර්සන් පාර |
| | | | එස්.ද.එස් ජයසිංහ මාවත(පල්ලිය පාර) |
| | | | ඒකනායක මාවත<br>ජම්බුගස්මුල්ල පා |
| | | | තිස්ස පාර<br>නාලන්දාරාම පාර |
| | | | ප්‍රිය මාවත |
| | | | සුමනාරාම පාර |
| | | | ශාන්ත ජෝශප් පාර |
| | | | සුනේත්‍රාදේවී පාර |
| | | | ෆීල්ඩ් මාවත |
| | | | විජයමංගලාරාම පාර |
| | | | වුඩ්ලන්ඩ් මාවත |
| කළුබෝවිල<br>**538** | **වර්ග කිලෝමීටර්-0.53 (හෙක්ටෙයාර්-53.0)** | **වීදි-11** | ඇන්ඩර්සන් පාර |
| | | | ඇලකණ්ඩිය පාර |
| | | | කඩවත පාර |
| | | | කොටගම වාචිස්සර මාවත |
| | | | පන්සල පාර(ජය මාවත) |
| | | | ප්‍රතිබිම්බාරාම පාර |

| | | | |
|---|---|---|---|
| | | | පරාක්‍රම මාවත (එස්.ද.එස් ජයසිංහ මාවත) |
| | | | පීරිස් මාවත |
| | | | මංගල පාර<br>රත්නාවලී පාර |
| | | | රෝහල පාර |
| | | | සුදර්ශි පාර |
| හත්බෝධිය<br>**538 බී** | **වර්ග කිලෝමීටර්-0.43 (හෙක්ටෙයාර්-43.75)** | **වීදි-15** | ඇලකණ්ඩිය පාර |
| | | | ශ්‍රී විමලසිරි පාර (කළුබෝවිල පාර) |
| | | | කැරන් පෙදෙස |
| | | | කොටගම වාචිස්සර මාවත |
| | | | කොටගම වාචිස්සර මාවත(කළුබෝවිල පාර) |
| | | | ආසිරි මාවත(3 වන ඇල පාර) |
| | | | අල්විස් මාවත |
| | | | ද සිල්වා පාර |
| | | | පී.රුබන් පීරිස් මාවත(2 වන ඇල පාර) |
| | | | ප්‍රතිබිම්බාරාම පාර |
| | | | පාසල් මාවත |
| | | | ශ්‍රී මහ විහාර මාවත<br>ශ්‍රී සරණංකර පාර |
| | | | හත්බෝධිය පාර |
| | | | විජයබා මාවත(4 වන ඇල පාර) |
| | | | අතපත්තු ටෙරස් |
| | | | අතපත්තු පාර |

| | | | |
|---|---|---|---|
| ගල්වල<br>**538 ඒ** | **වර්ග කිලෝමීටර්-0.46 (හෙක්ටෙයාර්-46.00)** | **වීදි-26** | අනගාරික ධර්මපාල මාවත (ඇලන් මාවත) |
| | | | ආතර් පෙදෙස(දෙහිවල) |
| | | | ඇලකණ්ඩිය පාර(ඇල ඉවුර පාර)<br>ඇලකණ්ඩිය පාර(ජය ශ්‍රී මාවත) |
| | | | කොටගම වාචිස්සර මාවත |
| | | | ගල්වල පාර |
| | | | ගල්වල පාර(අතපත්තු මාවත) |
| | | | ජයන්ති පාර<br>තිස්ස මාවත |
| | | | ගාළු පාර (දෙහිවල පාර) |
| | | | නගර සභා මාවත |
| | | | නගර සභා පටුමග |
| | | | නන්දමිත්‍ර පාර |
| | | | ප්‍රතිබිම්බාරාම පාර |
| | | | බොතේජු පාර(ශ්‍රී සරණංකර පාර) |
| | | | සිරිමල් මාවත |
| | | | සෞඛ්‍ය චතුරස්‍රය |
| | | | රොබට් පාර |
| | | | රොබට් පෙදෙස |
| | | | රෝහල පටුමග |
| | | | පින්වත්ත පාර |
| | | | මුවර් පාර |
| | | | මුස්ලිම් පල්ලිය පාර |

| | | | |
|---|---|---|---|
| | | | මෙන්ඩිස් පෙදෙස |
| දෙහිවල බටහිර<br><br>**540 ඒ** | **වර්ග කිලෝමීටර්-0.48** | **වීදි-23** | ද අල්විස් පෙදෙස<br>ඇතුලත වැන්ඩවට් පෙදෙස |
| | | | ඇතුලත ෆෙයාලයින් පාර<br>ඇනී මාවත |
| | | | ඇල්බට් පෙදෙස |
| | | | ඉනීෂියම් පාර |
| | | | එබනීසර් පෙදෙස |
| | | | කැම්බල් පෙදෙස |
| | | | පළමුවන පටුමග |
| | | | දෙවන පටුමග |
| | | | ගාළු පාර |
| | | | ප්‍රේෂර් මාවත |
| | | | ෆෙයාලයින් පාර |
| | | | ෆෙයාලයින් පාර ඔබ්බෙහි පටුමග |
| | | | වාසල පාර |
| | | | වැන්ඩවට් පෙදෙස |
| | | | වින්ඩ්සර් මාවත |
| | | | පීටර්ස් පටුමග |
| | | | පෙරේරා පටුමග |
| | | | මුහන්දිරම් පටුමග |
| | | | මෙල්ෆඩ් චන්ද්‍රවංකය |

| | | | |
|---|---|---|---|
| | | | රත්නාකර පෙදෙස |
| | | | රාමනාදන් මාවත |
| දෙහිවල නැගෙනහිර<br>**539/42බී** | **වර්ග කිලෝමීටර්-0.49 (හෙක්ටෙයාර්-49.5)** | **වීදි-22** | අනගාරික ධර්මපාල පෙදෙස |
| | | | අනගාරික ධර්මපාල පාර |
| | | | ගල්වල පාර<br>කුසලඥාන මාවත(ගල්වල පාර)<br><br>පාර්ක් ටෙරස්(ගල්වල පාර) |
| | | | චාල්ස් පෙදෙස |
| | | | ජයවර්ධන මාවත |
| | | | ජයසූරිය පෙදෙස |
| | | | මේජර් අජිත් ගුණතිලක මාවත (ද සම්පායෝ පාර) |
| | | | දෙහිවල පාර(ගාළු පාර) |
| | | | හිල්ඩා පටුමග /නිවාස |
| | | | ප්‍රනාන්දු පෙදෙස |
| | | | පාර්ක් වීදිය |
| | | | ලියනගේ පාර |
| | | | වෛද්‍ය පාර |
| | | | වෛද්‍ය පාර -1 වන පටුමඟ |
| | | | වෛද්‍ය පාර -අත්තම් නිවාස-රණජයගම |
| | | | වෛද්‍ය පාර -කෝවිලවත්ත-සංජයපුර |
| | | | දීපානන්ද මාවත(වෛද්‍ය පාර) |
| | | | වෛද්‍ය පාර ඔබ්බෙහි පටුමග |

| | | | |
|---|---|---|---|
| | | | වෛද්‍ය පෙදෙස |
| උද්‍යාන<br>**536 ඒ** | **වර්ග කිලෝමීටර්-0.53 (හෙක්ටෙයාර්-53.75)** | **වීදි-12** | අතපත්තු පෙදෙස |
| | | | අනගාරික ධර්මපාල පාර |
| | | | අනගාරික ධර්මපාල පාර(ප්‍රියරතනාරාම පෙදෙස) |
| | | | ඇලකණ්ඩිය පාර<br>ඇලකණ්ඩිය පාර(තාවකාලික නිවාස) |
| | | | ගල්වල පාර |
| | | | ගල්වල පාර(දෙමහල් නිවාස) |
| | | | නගර සභා නිවාස( A,B,C )<br>ප්‍රතිබිම්බාරාම පාර |
| | | | ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත |
| | | | සමන් මාවත |
| | | | වනරතන පෙදෙස |
| | | | ශ්‍රී වනරතනාරාම පාර |
| | | | පියරතනාරාම පාර |
| නැදිමාල<br>**536** | **වර්ග කිලෝමීටර්-0.70 (හෙක්ටෙයාර්-70.0)** | **වීදි-16** | කඩවත පාර |
| | | | පැරකුම්බා පාර |
| | | | ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත |
| | | | ග්‍රීන්ලන්ඩ් මාවත |
| | | | බෝධිරාජ මාවත(රූපසිංහ මාවත) |
| | | | රූපසිංහ මාවත |
| | | | කඩවත පාර ඇල ඉවුර |
| | | | ඇන්ඩර්සන් පාර |


| | | | |
|---|---|---|---|
| | | | මංගල පාර |
| | | | පීරිස් මාවත |
| | | | විෂ්ණු කෝවිල පාර |
| | | | බෙල්ලන්තර පාර |
| | | | කර්නල් මාවත |
| | | | නිකපේ පාර |
| | | | පැපිලියාන පාර<br>පැපිලියාන පාර(පහලවත්ත පාර)<br>අනගාරික ධර්මපාල පාර |
| | | | ධර්මරාජ මාවත |
| | | | ජයවර්ධන පෙදෙස |
| | | | ප්‍රියදර්ශනාරාම පාර |
| | | | ගල්වල පාර |
| | | | ශ්‍රී මේධංකර පාර |
| මල්වත්ත<br>**539/42ඒ** | **වර්ග කිලෝමීටර්-0.40 (හෙක්ටෙයාර්-40.50)** | **වීදි-10** | ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත |
| ජයතිලක<br>**540බී** | **වර්ග කිලෝමීටර්- 0.39** | **වීදි-20** | ලියනගේ පාර |
| | | | මල්වත්ත පාර |
| | | | මල්වත්ත හරස්පාර |
| | | | ෆෙයාලයින් පාර |
| | | | ග්‍රෙගරි පාර |
| | | | රොද්‍රිගු පාර |
| | | | දුම්රියපළ පාර (සෙන්පතිඑල්.වී.ගුණරත්න පාර) |
| | | | සන්ෂයින් මාවත(පී.ටී.ද සිල්වා මාවත) |

| | | | |
|---|---|---|---|
| | | | සේනානායක පෙදෙස |
| | | | ප්‍රනාන්දු උද්‍යාන(පෙදෙස) |
| | | | පාසැල් මාවත |
| | | | ප්‍රෙස්බිටිරියන් පටුමග |
| | | | විජය මාවත |
| | | | බොතේජු මාවත |
| | | | එදිරිවීර මාවත |
| | | | කල්දේරා මාවත<br>සුබෝධාරාම පාර |
| | | | ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත |
| | | | විජේසේකර පාර |
| | | | ෆෙයාලයින් පාර ඔබ්බෙහි පටුමග |
| | | | මල්වත්ත පාර |
| | | | දෙහිවල පාර(ගාළු පාර) |
| | | | ගාළු පාර (ගල්කිස්ස පාර) |
| කරගම්පිටිය<br>**539/42** | **වර්ග කිලෝමීටර්- 0.32 (හෙක්ටෙයාර්-32.5)** | **වීදි-22** | ප්‍රනාන්දු පෙදෙස |
| | | | ගාළු පාර(ගල්කිස්ස පාර) |
| | | | කව්ඩාන පාර |
| | | | කරගම්පිටිය හරස් පාර |
| | | | සුධර්ම මාවත(කව්ඩාන පාර) |
| | | | පල්ලියදොර පාර |
| | | | ධර්මාරාම පාර |
| | | | සුබෝධාරාම පාර |
| | | | ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත |

| | | | |
|---|---|---|---|
| | | | අපොන්සු මාවත |
| | | | ගාමිණී පෙදෙස |
| | | | ජයතිලක මාවත<br>ශාන්තාරාම පාර(නගරසභා නිවාස)<br>සිරිවර්ධන පාර |
| | | | යූනියන් පෙදෙස |
| | | | යෝගා පෙදෙස |
| නැගෙනහිර කව්ඩාන<br>**539/42බී** | **වර්ග කිලෝමීටර්- 1.22 (හෙක්ටෙයාර්-122.5)** | **වීදි-22** | අත්තිඩිය පාර |
| | | | බෙල්ලන්තර පාර<br>කර්නල් මාවත |
| | | | නිකපේ පාර |
| | | | විජිත මාවත |
| | | | පල්ලියදොර පාර |
| | | | ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත |
| | | | රෝහිණී පෙදෙස |
| | | | ශ්‍රී සිරිසගබෝ පාර |
| | | | සෝමානන්ද පාර |
| | | | ශ්‍රී සුධර්ම මාවත |
| | | | කව්ඩාන පාර |
| | | | කව්ඩාන පාර |
| | | | හීල් විදීය (ලෝටස් ග්‍රෝව්) |
| | | | ලේක් ක්‍රෙසන්ට්(කව්ඩාන අත්තිඩිය පාර) |
| | | | කව්ඩාන අත්තිඩිය පාර |
| | | | අල්විස් පෙදෙස |

| | | | |
|---|---|---|---|
| | | | බෝගහවත්ත පාර |
| | | | අත්තිඩිය ප්‍රධාන පාර |
| | | | 3 වන පටුමග |
| | | | සිද්ධාර්ථ පාර |
| | | | හීල් විදීය (ඇල ඉවුර) |

ග්‍රාම නිලධාරී වසම්


LAND MAN RATIO
2010
0.005
VILAWALA
0.005
SRI SARANANKARA
DUTUGAMUNU
KOHUWALA
0.006
HATHBODHIYA
0.008
0.010
0.012
0.007
GALWALA
KALUBOWILA
0.008
DEHIWALA EAST
DEHIWALA WEST
0.006
0.007
UDYANA
0.008
NADIMALA
0.006
JAYATHILAKA
MALWATHTHA
0.008
0.005
KARAGAMPITIYA
0.013
KAWUDANA EAST
LEGEND
Per Capita Land
0.005
0.006
0.007
0.008
0.01
0.012
0.013
500 0 500 1000 Meters
Prepared by Department of Land Use Planning
Land Use Planning Office Colombo